# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2019

2023 දෙසැම්බර්

මානවශාස්ත්‍ර පීඨය

**බෞද්ධ සංස්කෘතිය** (නව/පැරණි නිර්දේශය)

**බෞද්ධ සංස්කෘතියේ ශ්‍රී ලාංකේය වර්ධනය හා ආසියානු ව්‍යාප්තිය BUCU – E 3015**

කොටස් දෙකෙන්ම ඇතුළත් වන සේ ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි. කාලය : පැය 03 යි.

---

## I කොටස

01. ක්‍රි.පූ. 03 සියවසට පෙර ශ්‍රී ලාංකේය සමාජයේ ප්‍රචලිතව පැවති ජන ඇදහිලි හා විශ්වාස ගෙනහැර දක්වමින් එහිලා බුදුසමය පිළිබඳ දැනුමක් ද පැවති බවට අනුමාන කළ හැකි සාක්ෂි විභාග කරන්න.

02. මෙරට රාජ්‍යාගම බුදුදහම ලෙස තහවුරු වීමෙන් පසු එම තත්ත්වය යාවත්කාලීන කිරීමෙහි ලා ලාංකේය පාලකවරුන් තුළ පැවති උනන්දුව කෙසේ වීදැයි සනිදර්ශනව පහදන්න.

03. පොළොන්නරු කතිකාවතෙහි ව්‍යුහය දක්වා, කතිකාවත් මගින් අපේක්ෂිත පරමාර්ථය හා අරමුණු තහවුරු කරගැනීමෙහි ලා එමගින් ලැබෙන පිටිවහල ප්‍රමාණ කරන්න.

04. ශ්‍රී ලාංකේය භික්ෂූන්ගේ ජාතික මෙහෙවර ආගමික වගකීමක් සේ සලකා ක්‍රියාකළ අයුරු ඓතිහාසික නයින් විභාග කරන්න.

05. යුරෝපීය ජාතීන්ගේ පැමිණීම මගින් මෙරට සංස්කෘතියට එකතු වූ නවාංග මොනවාදැයි නිදසුන් මගින් පෙන්වා දෙන්න.

## II කොටස

06. බුද්ධකාලීන උත්තර භාරතීය ප්‍රධාන රාජධානීන්හි බුදුදහමේ සීඝ්‍ර ව්‍යාප්තිය හා වර්ධනය පිණිස ගිහි පක්ෂයෙන් ලද අනුග්‍රහය කවරේදැයි විමර්ශනය කරන්න.

07. භික්ෂු සමාජය නිකාය වශයෙන් බෙදීයාම සඳහා බුද්ධකාලයේ සිට පැන නැගුණු විවිධ හේතු සාධක කවරේදැයි පරීක්ෂා කරන්න.

08. ධර්මාශෝක මහරජතුමාගේ ආගමික ප්‍රතිපත්තිය, බෞද්ධ සංස්කෘතියේ රක්ෂණය හා පෝෂණය පිණිස ඉවහල් වූ අයුරු විස්තර කරන්න.

09. සංස්කෘතය භාෂා මාධ්‍යය කරගත් බෞද්ධ සම්ප්‍රදායයන්ගේ සංවර්ධනය පිණිස කුශාන වංශික පාලකවරුන්ගෙන් ඉටුවූ මෙහෙය අගය කරන්න.

10. සියම් - ලංකා බෞද්ධාගමික සබඳතා ථෙරවාද බෞද්ධ සම්ප්‍රදායයේ අභිවර්ධනය පිණිස ඉවහල් වූ අයුරු පෙන්වා දෙන්න.

*******************************